සැ. යු.- 2016.09.02 දින පළ වූ අංක 1,983 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,984 - 2016 සැප්තැම්බර් මස 09 වැනි සිකුරාදා - 2016.09.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බුද්ධල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 1122 |

*සැ. යු.* - වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත, 2016 ජූනි මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 සැප්තැම්බර් 30 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 සැප්තැම්බර් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2016 ජූනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විවිධ දැන්වීම්

## ලාෆීර් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ඒ. ඒ. අළුත්ගමගේ වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 48 (1) යටතේ "ලාෆීර් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි", යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

1. ළමයින්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම,
2. ජාතීන් අතර සාමය වර්ධනය කිරීම,
3. රටේ සංවර්ධනයට සහභාගීවීම,

යනාදිය වේ.

ඒ. ඒ. අළුත්ගමගේ,<br>
පාර්ලිමේන්තු මන්ත්‍රී,<br>
මහනුවර දිස්ත්‍රික්කය.

09-206

---

## දේශයේ පාරිසරික පර්ෂදය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය ජයම්පති වික්‍රමරත්න වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 48 (1) යටතේ ''දේශයේ පාරිසරික පර්ෂදය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී දේශයේ පාරිසරික පර්ෂදය සංස්ථාගත කිරීමයි :-

(1) පාරිසරික ක්ෂේත්‍රයේ දී ලබාගෙන ඇති ප්‍රගතීන් කලින් කලට සමාලෝචනය කිරීම සහ නිසි ක්‍රියාමාර්ග යෝජනා කිරීම,

(2) ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාවය, ගෘහස්ථ අපද්‍රව්‍ය කළමනාකරණය, විකල්ප බලශක්ති ප්‍රභවයන් ජනප්‍රිය කරවීම හා ප්‍රවර්ධනය කිරීම මෙන්ම අඩු වියදම් පාරිසරික සංරක්ෂණ තාක්ෂණයන් හුවමාරු කිරීම හා පහසු කරවීම සහ අදාළ රාජ්‍ය ආයතන වලට සහාය වීම,

(3) ශ්‍රී ලංකාවේ ස්වාභාවික, ජීව විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක නොවන සම්පත් සුරැකීම, දේශීය දැනුම සහ තාක්ෂණය, සංස්කෘතිකමය උරුමය ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම හා එම විෂයයනට අදාළ රාජ්‍ය ආයතනවලට සහාය වීම,

යනාදිය වේ.

ආචාර්ය ජයම්පති වික්‍රමරත්න,<br>
පාර්ලිමේන්තු මන්ත්‍රී.

09-249

## කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය

නඩු අංකය : මහාධිකරණය (සිවිල්) 07/2016 CO.

ස්වභාවය : ගණන් බේරා වසා දැමීම සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ සහ ඒ ප්‍රකාරව අධිකරණය මගින් ඈවර කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය පිළිබඳ කාරණය සම්බන්ධවයි.

එහි ලියාපදිංචි ලිපිනය :

රජගහ, බලගල්ල, දිවුලපිටිය, සහ
අංක 29/1, තකියා පාර, දළුවකොටුව, කොච්චිකඩේ, මීගමුව.

කව්ලූන් මයිනින් (ප්‍රයිවට්) ලිමිටඩ් (Kowloon Mining (Private) Limited) සම්බන්ධ කාරණාව පිළිබඳවයි.

හවු බින් ලියු (Mr. Hon Bin Liu)
අංක 4, විලේජ්ජ්රියා, මෙයිටන්ග්විලේජ්, සැන්ජිඔටවුන්, මෙයිජියැන්ග්ඩිස්ට්‍රික්, මෙයිෂුඔව්සිටි, ඥන්ඩොන්ග් ප්රොවින්ස් චයිනා

................................................*පෙත්සම්කරු.*

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා ඉහත ලිපිනයෙහි පදිංචි හවුබින් ලියු විසින් 2016 පෙබරවාරි මස 10 වන දින එකී අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත් එකී පෙත්සම වර්ෂ 2016 ක් වූ ඔක්තෝබර් මස 19 වැනි දින අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සම සම්බන්ධයෙන් නියෝගයක් කිරීම සඳහා සහාය වීමට හෝ විරුද්ධ වීමට කැමැත්තක් දක්වන එකී සමාගමේ කවර හෝ ණයහිමියෙකුට, දායකයෙකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ පුද්ගලිකව හෝ සිය නීතිඥවරයා මගින් පෙනී සිටිය හැකි බවත් පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණයහිමියෙකුට නියමිත ගාස්තු ගෙවීම මත පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

අත්සන් කලේ,

ප්‍රභාත් ධනුෂ්ක කොළඹගේ,
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්,
152 B6, අලුත්කඩේ වීදිය,
කොළඹ 12.

**සටහන :**

එකී පෙත්සම සම්බන්ධ විමසීමේදී පෙනීසිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් ප්‍රභාත් ධනුෂ්ක කොළඹගේ නීතිඥ මහතා වෙත ලිඛිතව දන්වා භාරදිය යුතු ය. දැනුම් දීම කරන පුද්ගලයාගේ නම සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය දැන්වීමේ ප්‍රකාශ කළ යුතු අතර පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු සිටීනම්) නීතිඥවරයා /නීතිඥවරිය විසින් අත්සන් කළ යුතු අතර 2016 ක් වූ ඔක්තෝබර් මස 18 වැනි දින පස්වරු 6.00 ට පෙර එය භාර දිය යුතු ය. තැපැල් මගින් එවන්නේ නම් ඔවුන්ට (ඉහත නම් සඳහන් නීතිඥවරයාට) උක්ත දිනට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව තැපැල් මගින් එවිය යුතු ය.

09-371

---

## පෙත්සම පිළිබඳ දැන්වීම

### (සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින්) කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

එච්සී (සිවිල්) අංක 37/2016/සීඕ

කොළඹ 10, මරදන, 1 වන කොට්ඨාසය, අංක 193 හි කලීල්ස් මරදන නර්සිං හෝම් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ කාරණාවේ දී ය.

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වන අයදුම්පතක් පිළිබඳ කාරණාවේ දී ය.

වෛද්‍ය එම්. නවාස් කලීල්, අංක 2136, කින්සයිඩ් වේ, සක්‍රමැන්ටෝ, 95825, කැලිෆෝර්නියා, ඇමරිකා එක්සත් ජනපදය.

(ඔහුගේ ඇටර්නි බලකරු වන කොළඹ 10, මරදාන, 1 වන කොට්ඨාසය, අංක 193 හි හුසේන් ඉම්තියාස් හුසේන් මගින් පෙනී සිටී.)

...............................................*පෙත්සම්කරු.*

*එදිරිව*

කොළඹ 10, මරදාන, 1 වන කොට්ඨාසය, අංක 193 හි කලීල්ස් මරදාන නර්සිං හෝම් (ප්‍රයිවට්) ලිමිටඩ්.

.............................................*වගඋත්තරකරු.*

සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා පෙත්සම්කරු වන ඇමරිකා එක්සත් ජනපදය, කැලිෆෝර්නියා, 95825, සක්‍රමැන්ටෝ, කින්සයිඩ් වේ, අංක 2136 හි වෛද්‍ය එම්. නවාස් කලීල් විසින් 2016 අගෝස්තු මස 02 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම 2016 නොවැම්බර් 01 වැනි දින අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියමකර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීමට සහයෝගය හෝ විරෝධය හෝ දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණයහිමියෙකු හෝ දයකයෙකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ නීතිඥ මහතෙකු හෝ ලේඛනගත නීතිඥයෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තව ද, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියම කර ඇති ගාස්තු ගෙවීම මත එය අවශ්‍ය වන සමාගමේ යම් ණයහිමියෙකු හෝ දයකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන්නේ ය.

නිත්ති මුරුගේසු ඇන්ඩ් ඇසෝසියේට්ස්,<br>පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥයින්,<br>අංක 28, (2 වැනි මහළ),<br>ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,<br>කොළඹ 02.

**සටහන :**

එකී පෙත්සම ඇසීමේ දී පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයෙකු එසේ කිරීමට ඇති ඔහුගේ අදහස ඉහත නම සඳහන් නීතිඥ ව්‍යාපාරය වන සහ නිත්ති මුරුගේසු ඇන්ඩ් ඇසෝසියේට්ස් මහතුන් වෙත ලිඛිතව හෝ තැපැල් මගින් භාර දිය යුතු ය. තැපැල් මගින් එවීම අවශ්‍ය වන පුද්ගලයින්ගේ නම් සහ ලිපිනය හෝ යම් ව්‍යාපාරයක් නම් එහි නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීම අවශ්‍ය වන අතර, එය පුද්ගලයා හෝ සමාගම හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥයින් ඇත්නම් ඔවුන් විසින් හෝ අත්සන් කරනු ලැබීම හා එය 2016 ඔක්තෝබර් මස 31 වැනි දින පස්වරුවේ වේලාව 6.00ට පෙර ඉහත නම සඳහන් අයවලුන්ට ලැබෙන සේ කල් වේලා ඇතිව භාර කිරීම හෝ තැපැල් කරනුයේ නම්, එසේ කිරීම අවශ්‍ය වේ.

නිත්ති මුරුගේසු ඇන්ඩ් ඇසෝසියේට්ස්,<br>පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥයින්.

09-377